# BUSINESS ORGANIZATIONS

# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>හවුල් ව්‍යාපාර</u>

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ හවුල් ව්‍යාපාරයක් පහත පරිදි නිර්වචනය කර ඇත.

ලාභ ඉපැයීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය හවුල් ව්‍යාපාරයක් වේ.

**නිදසුන් :**

- ගුණවර්ධන සහ පුත්‍රයෝ
- දොන් කරෝලිස් සහ පුත්‍රයෝ

# <u>හවුල් ව්‍යාපාරයක ලක්ෂණ</u>

- ලාභ ලැබීමේ අරමුණක් තිබීම
- ව්‍යාපාර කටයුත්තක් පැවතීම
- පුද්ගලයින් සිටීම
- අන්‍යොන්‍ය සම්බන්ධතාවක් (එකඟතාවක් ) තිබීම

ClassWork.LK

# හවුල් ව්‍යාපාරයකට සුවිශේෂී ලක්ෂණ

- හවුල්කරුවන් අවම සංඛ්‍යාව දෙදෙනෙකු සිටිය යුතු අතර උපරිමය 20 ට සීමා වීම

- හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම

- ලාභ බෙදා ගැනීම සඳහා වූ යම් ඵකඟතාවක් දැකිය හැකි වීම

- සෑම හවුල්කරුවෙකු ම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයකු හා ප්‍රධානියෙකු වශයෙන් සැලකීම (අන්‍යෝන්‍ය නියෝජනත්වය)

- කිසියම් ව්‍යාපාර කටයුත්තක් පැවතීම

ClassWork.LK

## හවුල් ගිවිසුම

හවුල් ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කොට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කර ගනු ලබන එකඟතාව හවුල් ගිවිසුම ලෙස හඳුන්වයි.

හවුල් ගිවිසුමක් වාචික ව, ලිඛිත ව හෝ ව්‍යංගයෙන් ඇති විය හැකි ය.

## හවුල් ඔප්පුව

හවුල්කරුවන් අතර ඇති කර ගන්නා ලිඛිත ගිවිසුම, හවුල් ඔප්පුව හෙවත් හවුල් ව්‍යවස්ථාවලිය ලෙස හඳුන්වයි.

### හවුල් ඔප්පුවක් වැදගත් වීමට හේතු

- හවුල්කරුවන් අතර මතභේද හා ආරවුල් බොහෝ දුරට විසඳා ගත හැකි වීම

- හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වා ගෙන යාමේ දී පහසුවක් වීම

ClassWork.LK

## <u>හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් කරන කරුණු</u>

- ව්‍යාපාරය පිළිබඳ මූලික තොරතුරු

**නිදසුන් :**

ව්‍යාපාරයේ නම, හවුල්කරුවන්ගේ නම් හා ලිපින, ව්‍යාපාරයේ ස්වභාවය, හවුල් ව්‍යාපාරයේ කාල සීමාව

- ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර
- ලාභාලාභ බෙදා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු
- හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
- හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳ සීමා
- ප්‍රාග්ධන පොළී හා ගැනිලි පොළී පිළිබඳ තොරතුරු
- හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳ කොන්දේසි
- අමතර ප්‍රාග්ධනය යෙදීම සම්බන්ධ කොන්දේසි

ClassWork.LK

- නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේ දී, සිටින හවුල්කරුවෙකු ඉවත් ව යාමේ දී, හවුල්කරුවෙකුගේ මරණයේ දී කටයුතු කරන ආකාරය

## 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය

හවුල් ව්‍යාපාරයක ලිඛිත ගිවිසුමක් නො මැති විටක හෝ ගිවිසුමේ සඳහන් නොවූ කරුණක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ අවස්ථාවක 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර ව කටයුතු කළ යුතු වේ.

## හවුල් ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් කරුණු

- හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ හවුල්කරුවන් සමාන ව බෙදා ගත යුතු අතර හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය සමාන ව බෙදා ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
- ව්‍යාපාරය වෙනුවෙන් හවුකරුවන් පෞද්ගලික ව දරන ලද වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ආපසු ගෙවිය යුතු ය.

- ගිවිසගත් ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් විසින් සපයා ඇති මුදල් සඳහා 5% ක වාර්ෂික පොළියක් හිමි වේ.

ClassWork.LK

- ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක් කිසි ම හවුල්කරුවෙකුට හිමි නොවේ.

- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගී වීමට සෑම හවුල්කරුවෙකුට ම අයිතිය ඇත.

- කිසි ම හවුල්කරුවෙකුට තම සේවය වෙනුවෙන් වේතනයක් හවුල් ව්‍යාපාරයෙන් ලැබිය නො හැකි ය

- සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්ත නැති ව නව හවුල්කරුවෙකු බඳවා ගත නො හැකි ය.

- හවුල් ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පැන නගින සාමාන්‍ය ගැටලුවක දී හවුල්කරුවන්ගේ වැඩි ඡන්දයෙන් තීරණයක් ගත හැකි අතර, හවුල් ව්‍යාපාර කටයුතුවල ස්වභාවය වෙනස් කෙරෙන කිසිවක් සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්තෙන් තොර ව කළ නො හැකි ය.

- හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් ප්‍රධාන කාර්යාලයේ තැබිය යුතු අතර, ඕනෑ ම අවස්ථාවක දී ඒවා පරීක්ෂා කිරීමට, පිටපත් කර ගැනීමට සියලු ම හවුල්කරුවන්ට අවසර තිබිය යුතු ය.

ClassWork.LK

# හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය

හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට සමාන වේ.

# හවුල් ව්‍යාපාරයක වාසි

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- පහසුවෙන් විසුරුවා හැරිය හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම
- කිහිපදෙනෙකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකි වීම
- වගකීම කිහිපදෙනෙකු අතර බෙදී යාම
- සාමූහික වගකීම නිසා ඇති වන උනන්දුව හා කාර්යක්ෂමතාව

ClassWork.LK

# හවුල් ව්‍යාපාරයක සීමා

- හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම

- හවුල්කරුවන් අතර ඇති විය හැකි මතභේද හවුල් ව්‍යාපාරයට අහිතකරලෙස බලපෑම

- එක් හවුල්කරුවෙකුගේ ක්‍රියා කලාපය නිසා සියලුම හවුල්කරුවනගේ වගකීමට බැඳීම

ClassWork.LK

# කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර සැසඳීම

| නිර්ණායකය | කේවල ස්වාමි ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | එක් පුද්ගලයෙකි | අවමය 2 යි, උපරිමය 20 |
| ප්‍රාග්ධනය යෙදවීම | අයිතිකරු විසින් යොදවයි | හවුල්කරුවන් විසින් යොදවයි |
| පරිපාලනය | අයිතිකරු විසින් සිදු කරයි | හවුල්කරුවන් විසින් සිදු කරයි |
| වගකීම | තනි ව වගකියයි | හවුල්කරුවන් විසින් සිදු කරයි |
| ලාභපාඩු භුක්ති විදීම | තනි ව භුක්ති විදියි | සාමුහික ව වගකියයි |
| තීරණ ගැනීම | ස්වාධීන ව සිදු කරයි | හවුලේ භුක්ති විදියි |
| විසුරුවා හැරීම | විසුරුවා හැරීමක් සිදු නොවේ.<br>අභිමත පරිදි ව්‍යාපාරය අවසන් කළ හැකි ය | ස්වේච්ඡාවෙන් හෝ අධිකරණය මගින් විසුරුවා හැරේ. |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura